ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය II කොටස

අවසාන පරීක්ෂණය 2006

අධ්‍යාපන තාක්ෂණය, ඉගැන්වීමේ ක්‍රම සහ සන්නිවේදන කුසලතා - **ESP 2261**

කාලය - පැය තුනයි (03)

---

දිනය : 2006.02.27 වේලාව : පෙ.ව.10.00 සිට ප.ව.01.00 දක්වා

---

ප්‍රශ්න <u>*තුනකට (03) පමණක්*</u> පිළිතුරු සපයන්න.
සෑම පිළිතුරක් සඳහාම වෙනම පොතක් භාවිතා කළ යුතුයි.

01. (i) "අධ්‍යාපන තාක්ෂණය" අර්ථ දක්වා එය "අධ්‍යාපනය තුල තාක්ෂණයෙන් "වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 30)

(ii) තාක්ෂණයෙන් හෙබි ඉගෙනුම් පරිසරයක්, **(technology - enhanced learning enviroment)** නිර්මාණය කිරීමේදී සැලකිළිමත් විය යුතු ප්‍රධාන කරුණු තුනක් කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 30)

(iii) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට නව තාක්ෂණය සම්බන්ධ කර ගැනීමට දරණ ප්‍රයත්න වලදී ගුරුවරුන් මුහුණ දෙන අභියෝග හතරක් විස්තර කරන්න.
(ලකුණු 40)

02. (i) "සන්නිවේදන ක්‍රියාවලිය" යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිළි කරන්න.
(ලකුණු 30)

(ii) ඔබ විසින් අධ්‍යයනය කරන ලද සන්නිවේදන ආකෘති තුනක් සැලකිල්ලට ගනිමින්, සන්නිවේදන ක්‍රියාවලිය තේරුම් ගැනීම සඳහා සන්නිවේදන ආකෘති, පුද්ගලයෙකුට සහය වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.
(ලකුණු 40)

(iii) ගුරු ශික්ෂකයකු හට **(teacher educator)** සන්නිවේදන ආකෘති පිළිබඳ දැනුම අවශ්‍ය වන්නේ මන්දැයි සුදුසු නිදසුන් දක්වමින් පැහැදිළි කරන්න.
(ලකුණු 30)

03. (i) සංසටනවාදී ඉගෙනුම් ප්‍රවේශයක් **(constructivist learning approach)** ඇති කිරීමට උදව් වන ඉගෙනුම් ක්‍රම දෙකක් විස්තර කරන්න.
(ලකුණු 30)

(ii) උපදේශනවාදී ඉගෙනුම් පරිසරයකදී **(instructivist learning environment)**මෙන් නොව සංසටනවාදී ඉගෙනුම් පරිසරයක ඉගෙනුම ලබන්නන්ගේ භූමිකාවේ දැකිය හැකි වෙනස් ලක්ෂණ හතරක් පැහැදිළි කරන්න.
(ලකුණු 40)

(iii) සංසටනවාදී ඉගෙනුම් පරිසරයකදී තාක්ෂණයේ භූමිකාව කෙබඳු වේ ද?
(ලකුණු 30)

04. (i) මුද්‍රිත ස්වයං ඉගෙනුම් ද්‍රව්‍ය හා ශ්‍රව්‍ය -දෘශ්‍ය ඉගෙනුම් ද්‍රව්‍ය අතර ඇති ප්‍රබලතා හා දුබලතා සංසන්දනය කරන්න.

(ලකුණු 30)

(ii) ඉගෙනුම් සම්පත් ලෙස අධ්‍යාපනික රූපවාහිනිය සහ අධ්‍යාපන වීඩියෝ භාවිතයේ ප්‍රයෝජන සහ සීමාවන් කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 30)

(iii) පංතිකාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත කෙරෙන ශ්‍රව්‍ය පට සහ ගුවන්විදුලි වැඩ සටහන්වල ලක්ෂණ සහ කාර්යයන් විස්තර කරන්න.

(ලකුණු 40)

05. (i) ශිෂ්‍යයන් "පරිගණක <u>තාක්ෂණයෙන්</u> ඉගෙනුම ලැබීම" නොව "පරිගණක <u>තාක්ෂණය සමග</u> ඉගෙනුම ලැබීම" යන්න නිදසුන් ඇසුරෙන් පැහැදිළි කරන්න.

(ලකුණු 30)

(ii) ගුරු ශික්ෂකයකුගේ වෘත්තීයමය ක්‍රියාකාරකම් පහසු කරලීමට උපකාරී වන, අන්තර්ජාලයේ ඇති සේවාවන් හතරක් විස්තර කරන්න.

(ලකුණු 40)

(iii) අන්තර්ජාලය ඔස්සේ සිදු කෙරෙන සන්නිවේදන ආකාර 3 ක් නම් කර, ඉන් එක් ආකාරයක් සිසුන් අතර සහයෝගී ඉගෙනුමකට උදව් වන අයුරු පැහැදිළි කරන්න.

(ලකුණු 30)

06. පහත දැක්වෙන ඕනෑම <u>කරුණු තුනක් (03)</u> පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) තොරතුරු සපයා ගැනීමේ මූලාශ්‍රයක් ලෙස අන්තර්ජාලයේ ප්‍රබලතා සහ සීමාවන්.

(ii) අධ්‍යාපනික වීඩියෝ පටවල නිෂ්පාදන ස්වරූප **(production formats)** සහ පංතිකාමර ඉගැන්වීමේදී ඒවායේ යෝග්‍යතාවය.

(iii) ඉගෙනුම් ක්‍රියාවලියේදී අන්තර් ක්‍රියාකාරී බහුමාධ්‍ය**(interactive multimedia)**වල දායකත්වය

(iv) තාක්ෂණික උපකරණවල නඩත්තුව සහ ආරක්ෂක ක්‍රියාමාර්ග

(iv) ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදයක් තෝරා ගැනීමේදී සැළිකිලිමත් විය යුතු ප්‍රධාන කරුණු

(ලකුණු 33 1/3 බැගින්)

\- හිමිකම් ඇවිරිණි. -